**ශීර්ෂය - 203- ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 203 - ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 ජූනි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව සියයට 6 කට සමාන ප්‍රතිපාදන කපා හැරීමෙන් පසුව ද වැය විෂයයන් 5 කට අදාළව සියයට 60 ත් සියයට 84 ත් අතර ප්‍රතිශතයක ප්‍රතිපාදන ඉතිරිකිරීම් පැවතීමෙන් තාත්වික ආකාරයට ඇස්තමේන්තු පිළියෙල කර නොමැති බව නිරීක්ෂණය විය. | අරපිරිමැසුම්දායි ලෙස වියදම් දැරීම, අපේක්ෂිත පරිදි වියදම් ඇති නොවීම සහ දහම් පාසැල් නියමිත කාලය තුළ නොපැවැත්වීම යනාදි කරුණු හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වූ බව දන්වා තිබුණි. | ප්‍රමුඛ අවශ්‍යතා අනුව ඇස්තමේන්තු සකස් කර ප්‍රතිපාදන ලබා ගැනිමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මරදමඩු දේවස්ථානයේ වන්දනා ශාලාව 2017 වර්ෂයේ ඉදිකර නිම කිරීමට අපේක්ෂා කර තිබුණ ද, 2017 වර්ෂයේදී රු.මිලියන 2.5 ක් වැය කර ගොඩනැඟිල්ලේ පාදම සහ කණු පමණක් ඉදි කර වර්ෂ 06 ක් ගත වී තිබුණද ඉදිකිරීම් කටයුතු නිම කර නොතිබුණි. | 2024 අයවැය මගින් ලද රු.මිලියන 5 ක ප්‍රතිපාදන නිදහස් කර ඇති අතර ඊට අදාලව මේ වන විට මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති අවසන් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2006 වර්ෂයේදී ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවට පවරා තිබුණු තලවිල චාරිකා නිවාසය පිහිටි ඉඩමේ අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | අදාළ ඉඩම දෙපාර්තමේන්තුව වෙත පැවරීම කල්පිටිය ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත නිර්දේශ කර ඇති අතර පැවරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරන බව දන්වා තිබුණි. | අදාළ ඉඩමේ අයිතිය පවරා ගැනීමට නොපමාව කටයුතු කළ යුතු වේ. |

## 3.3 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට අයත් 2019 වර්ෂයේදී අනතුරකට ලක්වූ වාහනයකට අදාළ රු.137,707 ක අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අනතුරට අදාළව රු.137,707 ක මුදල ගෙවන ලෙස නීතිපති දෙපාර්තමේන්තුව මඟින් අනෙක් පාර්ශවය වෙත දන්වා ඇතත් ගෙවීම් පැහැර හැර ඇති බැවින් නිතීපති විසින් පවරා ඇති නඩුව මේ වන විට විභාග වෙමින් පවතින බව දන්වා තිබුණි. | අලාභය අය කර ගැනීමට නොපමාව ක්‍රියා කළ යුතු වේ. |

## 3.4 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දහම් පාසැල් ගුරුවරුන්ට දීමනා, නිල ඇඳුම් වැනි අනුග්‍රහයන් ලබාදීමේදී ලියාපදිංචිය සම්බන්ධයෙන් සලකා බැලුව ද, පවත්නා කතෝලික හා ක්‍රිස්තියානි දේවස්ථාන හා ආගමික මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීමේ විධිමත් ක්‍රමවේදයක් නොමැති බවත් ඒ සම්බන්ධයෙන් අදාළ දේවස්ථාන හා ආගමික මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම සඳහා කෙටුම්පත් කර ඇති පනත අනුමත කර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | කතෝලික දේවස්ථාන ලියාපදිංචිය බොහෝදුරට අවසන් කර ඇති අතර, නව ලියාපදිංචි කිරීම් පැවති ක්‍රමවේදයටම සිදු කරමින් පවතී. ක්‍රිස්තියානි දේවස්ථාන හා ආගමික මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීමට ක්‍රමවේදයක් නොමැති අතර කෙටුම්පත් කර ඇති පනත අනුමත කිරීමට ඇති ගැටලුකාරී තත්ත්වයන් නිසා අමාත්‍යාංශය විසින් විද්වත් කමිටුවක් මගින් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයක් සකසමින් පවතී. ඒ සඳහා අවශ්‍ය අයදුම්පත් සහ කොන්දේසි සකස් කර අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති අතර අනුමැතිය ලද වහාම ලියාපදිංචි කිරීම් ආරම්භ කරන බව දන්වා තිබුණි. | පනත අනුමත කර ගැනීමේ කටයුතු කඩිනම් කල යුතුය. |
| (ආ) | කඩිනමින් ප්‍රතිසංස්කරණය කළ යුතු පුරාවිද්‍යා වටිනාකමක් ඇති දේවස්ථාන ප්‍රතිසංස්කරණයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය, අධීක්ෂණය හා උපදෙස් මත කටයුතු කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබූ අවස්ථා 2 ක් නිරීක්ෂණය වූ අතර ප්‍රතිසංස්කරණ | පුරාවිද්‍යා වටිනාකමක් සහිත කඩිනමින් ප්‍රතිසංස්කරණය කළ යුතු ව්‍යාපෘතියක් වෙනුවෙන් 2022 වසරේදී පුරාවිද්‍යා අනුමැතිය ඉල්ලා තිබුණද, 2023 වසර දක්වාම එම දෙපාර්තමේන්තුවේ විරෝධයක් හෝ පැමිණිල්ලක් නොතිබීම හා එම ගොඩනැගිල්ල | පුරාවිද්‍යා වටිනාකමක් ඇති දේවස්ථාන ප්‍රතිසංස්කරණයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය, අධීක්ෂණය හා |

| | | |
|---|---|---|
| කටයුතු සඳහා දේවස්ථාන වෙත සමාලෝචිත වර්ෂයේදී රු.2,940,728 ක මූල්‍යාධාර ලබා දී තිබුණ ද, ඇතැම් දේවස්ථාන වෙතින් එක් එක් කාර්යයට අදාළ ඇස්තමේන්තුව, කොන්ත්‍රාත් ගිවිසුම, මිනුම් පත්‍ර සහ වැඩ අවසන් කිරීමේ සහතිකය යනාදී තොරතුරු ලබා ගැනීමටත්, ඒ සම්බන්ධයෙන් පසුවිපරම් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | ඉතා පැරණි කඩිනම් ප්‍රතිසංස්කරණයට ලක්විය යුතුව තිබූ බැවින් ලිඛිත අනුමැතිය ලැබෙන තෙක් නොසිට ප්‍රතිසංස්කරණ කටයුතු ඉදිරියට කරගෙන ගොස් ඇති බව දන්වන අතර 2024 වසරේදී කරගෙන යමින් පවතින පුරාවිද්‍යා වටිනාකමක් සහිත සියලුම ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණක් ප්‍රතිපාදන නිදහස් කෙරේ. තවද සංවර්ධන ව්‍යාපෘති දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන නිදහස් කර ප්‍රාදේශිය ලේකම් කාර්යාල හරහා සිදු කරනු ලබන බැවින් අදාල ලේඛන දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් ඉල්ලීම් කළද නොලැබුණ අවස්ථා ඇත. නමුත් වැඩ අවසන් වූ සියලුම ව්‍යාපෘති වසරක් දක්වා කාලයක් සෑම මාස 03කට වරක්ම දෙපාර්තමේන්තු සංවර්ධන නිලධාරීන් මගින් ක්ෂේත්‍ර පරීක්ෂා සිදු කර පසුවිපරම් කටයුතු සිදු කර ඇති බව දන්වා තිබුණි. | උපදෙස් මත කටයුතු කළ යුතු අතර සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ප්‍රතිපාදන නිදහස් කළ පසු ඊට අදාළ තොරතුරු ලබා ගැනීමට හා පසුවිපරම් කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 134 (2) සහ 2019 ජනවාරි 12 දිනැති DMA/01/2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කිරීමේදී විගණකාධිපති විමසා පිළියෙල කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2025 වසරට අදාල අභ්‍යන්තර විගණන සැලැස්ම සඳහා විගණකාධිපතිවරයාගේ එකඟතාවය ලබාගැනීම සඳහා ඉදිරියේදි කටයුතු කරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි සහ අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව එකම සේවා ස්ථානයේ සේවා කර ඇති වසර 05ක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩ දීම සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත් 2023 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05ක සිට 18 දක්වා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරින් 33 දෙනෙකු සඳහා ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කර නොතිබුණි. | ස්ථානමාරු චක්‍රලේඛය ප්‍රකාරව වසර 05 ට වඩා වැඩි සේවයේ නියුතු නිලධාරීන්ගේ විස්තර සහ ස්ථානමාරු ඉල්ලූ නිලධාරීන්ගේ විස්තර නිර්දේශ කර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්ෂිකව ඉදිරිපත් කරනු ලබන අතර නිලධාරින්ට ස්ථානමාරු ලබාදීම මෙම දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර කටයුත්තක් බව දන්වා තිබුණි. | රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය සමඟ සම්බන්ධීකරණය වී දිගු කාරලයක සිට ආයතනයේ සිටින නිලධාරින් සඳහා ස්ථාන මාරුවීම් ලබාදීමට කටයුතු කල යුතුය. |